**පළමු වාර පරීක්ෂණය - 2012**

**බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය**

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය :- පැ. 2 |
|---|---|---|

නම :- ........................................ ඇ.අංකය :- ........................ පංතිය :- ............

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා දී ඇති පිළිතුරු පත්‍රයේ අදාළ අංකය මත × ලකුණ යොදන්න.**

1. "මිනිස් පරපුර නැමැති වෘක්ෂය අපමණ කලකට පසුව පිපෙන, පිපුණාට පසු ප්‍රඥා සුගන්ධයෙන් සහ කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුරජාණන් වහන්සේය." මෙලෙස ප්‍රකාශ කළේ,

   (i) ආචාර්ය ස්වෙපල්ලි රාධ ක්‍රිෂ්ණන් ය. (ii) එච්.ජී. වේල්ස් ය.

   (iii) සර්.එඩ්වින් ආර්නෝල්ඩ් ය. (iv) ජවහල්ලාල් නේරු ය.

2. "පුණ්ඩරිකං ගාථා වග්ගු - තෝයේන නුපලිප්පති" යන ගාථාවේ දැක්වෙන පරිදි බුදුරජාණන් වහන්සේ කෙලෙස් සහිත ලෝකයේ කෙලෙස්වලින් තොරව, නැගැටී වැඩ සිටීම.

   (i) පද්මාකාර ජීවිතය නමින් හැඳින්වේ. (ii) අනගාරික ජීවිතය නමින් හැඳින්වේ.

   (iii) අසමාහිත ජීවිත නමින් හැඳින්වේ. (iv) කාරුණික ජීවිතය නමින් හැඳින් වේ.

3. බුදු සසුනෙහි ප්‍රථම ද්වෙවාචික උපාසක වරුන් වනුයේ,

   (i) උපතිස්ස හා කෝලිත (ii) තපස්සු හා භල්ලුක

   (iii) පස්වග මහණුන් (iv) භද්දවග්ගිය කුමාරවරුන්

4. ධම්ම පද ගාථා ගණන,

   (i) 400 කි. (ii) 410 කි. (iii) 420 කි. (iv) 423 කි.

5. මහින්දාගමනයෙන් පසු මෙරට ඉදිවූ ප්‍රථම ස්තූපය නම්,

   (i) ථූපාරාමය (ii) රුවන්වැලි මහා සෑය

   (iii) අභයගිරිය (iv) මිරිසවැටිය

6. ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් අංග අතරින් සතර ආකාර වූ නිවැරදි උත්සාහය පිළිබඳව හඳුන්වාදෙනු ලබන අංගය නම්,

   (i) සම්මා ආජීව (ii) සම්මා සමාධි

   (iii) සම්මා සති (iv) සම්මා වායාම

7. සංසාර සාගරයෙන් එතෙර යාමට උපකාරවන ධර්ම සමූහය.

(i) සමජීවිකා නම් වේ. (ii) පාරමිතා නම් වේ.

(iii) කුසලතා නම් වේ. (iv) පින්කිරියවත් නම් වේ.

8. ගිහි බෞද්ධයන් රැකිය යුතු නිත්‍ය ශීලය,

(i) පංච ශීලය (ii) අෂ්ඨාංගික ශීලය

(iii) සමථ භාවනාවය (iv) විපස්සනා භාවනාවය.

9. ''සියලුම බුදුවරයන්ගේ අනුශාසනා සමාන බැව්'' පෙන්වා දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වනුයේ,

(i) සබ්බ පාපස්ස අකරණං (ii) නහිවේරේන වේරානි

(iii) අසාරේ සාරමතිනෝ (iv) උට්ඨානවතෝ සතිමතෝ යන්න ය.

10. ''වෛරයෙන් වෛරය නොසන් සිඳෙන'' බව පෙන්වා දෙන ධම්ම පද ගාථාවේ මුල් පදය වනුයේ,

(i) සබ්බ පාපස්ස අකරණං (ii) න හි වේරේන වේරානි

(iii) අසාරේ සාරමතිනෝ (iv) සාරංච සාරතෝ ඤත්වා.......... යන්නය.

11. බෞද්ධයාගේ අත්පොත වනුයේ,

(i) ධම්ම පදයයි.
(ii) පිරිත් පොතයි.
(iii) ජාතක කතා පොතයි.
(iv) පාසලේ තමාට අයිති බුද්ධ ධර්මය පොතයි.

12. චම්පා නුවර ගර්ගරා පොකුණ සමීපයේ බුදුරජාණන් වහන්සේ වැඩ සිටින විට එතුමා හමුවට පැමිණි බමුණා වනුයේ,

(i) වප්ප බමුණා (ii) උපක බමුණා

(iii) නාලක බමුණා (iv) සොණදණ්ඩ බමුණා

13. ආසියාවේ ආලෝකය නමැති ග්‍රන්ථයේ කතුවරයා වනුයේ,

(i) එච්. පී. වේල්ස් (ii) එඩ්වින් ආර්නෝල්ඩ් ය.

(iii) ගුණපාල මලලසේකරය. (iv) කුමාරතුංග මුණිදාසය.

14. සතර අගතියට අයත් නොවන්නකි.

(i) ඡන්ද (ii) මෝහ (iii) භය (iv) භාවනා

15. සමථ භාවනාවේ කර්මස්ථාන ගණන වනුයේ,

(i) 10 (ii) 20 (iii) 30 (iv) 40 කි.

16. පංච නීවරණ ධර්ම අතරට ගැනෙන සිතෙහි නොසන්සුන් ගතිය හඳුන්වන්නේ,

(i) කමච්ඡන්ද නම්නි (ii) ව්‍යාපාද නම්නි

(iii) ථීන මිද්ද නම්නි (iv) උද්ධච්ච කුක්කුච්ච නම්නි

17. සම්බුද්ධ ශාසනයේ සිව්වනක් පිරිස ලෙස හඳුන්වන්නේ,

(i) භික්ෂු, භික්ෂුණී, සාමණේර හා ගිහි පිරිස

(ii) සෝවාන්, සකෘදාගාමී, අනාගාමී අර්හත්

(iii) භක්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා

(iv) බුදු, පසේබුදු, මහරහත්, අරහත්

18. ''සබ්බේ සංඛාරා අනිච්චා'' සියලු සංස්කාරයෝ අනිත්‍යය. යනාදී වශයෙන් මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව.

(i) කමටහන් හාවනාව (ii) කසිණ හාවනාව

(iii) සමථ හාවනාව (iv) විපස්සනා හාවනාව

19. පුද්ගලයාගේ සිතෙහි ඇති පංචනීවරණ යටපත් කරමින් කරන භාවනාව,

(i) සමථ හාවනාව (ii) විදර්ශනා හාවනාව

(iii) කායගතා හාවනාව (iv) ප්‍රඥා හාවනාව

20. විශාඛා මහා උපාසිකාව විසින් බුදුරජාණන් වහන්සේට පූජා කරනු ලැබූ ආරාමය,

(i) වේළුවනාරාමය (ii) පූර්වාරාමය

(iii) පූර්වාරාමය (iv) ජේතවනාරාමය

21. චුල්ල කම්ම විභංග සූත්‍රයට අනුව නිතර කිපෙන සුළු බවින් යුක්තව සිටීමේ ආදීනව නම්,,

(i) තේජස් අඩු තැනැත්තෙක් වීම (ii) අඩු වයසින් මිය යාම

(iii) දිළින්දෙක් වීම (iv) ශෝභා සම්පන්න නොවීම.

22. ''පංච සතිකා'' යනුවෙන් හඳුන්වන්නේ, කීවෙනි සංගායනාව ද?

(i) 2 (ii) 3 (iii) 4 (iv) 1

23. බුදු රජාණන් වහන්සේගේ ගුණ,

(i) 6 (ii) 9 (iii) 8 (iv) 24

24. විහාරස්ථානයක ගිය පසු පිළිවෙලින් වැදුම් පිදුම් කළ යුතු ස්ථාන වනුයේ,

(i) බෝධිය, බුදුගෙය, චෛත්‍යය (ii) චෛත්‍යය, බෝධිය, බුදුගෙය

(iii) බුදුගෙය, බෝධිය, චෛත්‍යය (iv) බුදුගෙය, චෛත්‍යය, බෝධිය.

25. ''වේළුවනාරාමය'' බුදුරජාණන් වහන්සේට පූජා කරනු ලැබුවේ.

(i) අනේපිඬු සිටුතුමා (ii) බිම්බිසාර රජතුමා

(iii) සුද්ධෝදන රජතුමා (iv) කොසොල් රජතුමා

26. සිදුහත් කුමාරයා මතු බුදුවන බවට අනාවැකියක් කී මුල්ම තැනැත්තා වූයේ,

(i) නාලක බමුණා (ii) ආලාර කාලාම

(iii) අසිත තවුසා (iv) සච්චක බමුණා

27. අප මහා බෝසතාණන් දාන පාරමිතාව පිරූ ජාතක කතාව වනුයේ,

(i) තේමිය ජාතකය (ii) ලෝමහංස ජාතකය

(iii) උම්මග්ග ජාතකය (iv) වෙස්සන්තර ජාතකය.

28. මෛත්‍රී භාවනාවේ අනුසස් ගණන,

(i) 6 (ii) 10 (iii) 5 (iv) 11

29. පුද්ගලයෙකුගේ මෙලොව දියුණුවට හා සැම දෙනාටම මෛත්‍රිය පතුරුවා ලීමට දේශනා කළ සූත්‍ර දෙක වනුයේ,

(i) මංගල - රතන සූත්‍රය (ii) සිඟාලෝවාද - පරාභව සූත්‍රය

(iii) මංගල - කරණීය මෙත්ත සූත්‍රය (iv) රතන - මංගල සූත්‍රය.

30. සිදුහත් බෝසතානන් වහන්සේට අවසන් දානය පූජාකරනු ලැබුවේ,

(i) විශාකා සිටු දුව (ii) චුන්ද කර්මාර පුත්‍රයාය.

(iii) ඛේමා සිටු දුව (iv) සුජාතා සිටු දුව

31. නිවන සඳහා වන ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු මහා සංඝරත්නය සතු සඟ ගුණය නම්,

(i) ඤාය පටිපන්න (ii) සුපටිපටිපන්න

(iii) උජුපටිපන්න (iv) සාමීචිපටිපන්න.

32. හිමිදිරියේ තම ගෙවත්තෙන් කඩා ගත් මල් කිනිත්ත දමා මල් බඳුනක් සැරසූ දිනිති එය තම පොත් මේසය මත තැබුවේ මහත් සතුටකිනි. පසුදින මේසය මත විසිරී පරව වැටුණ මල් දුටු දිනිතිට සිහිපත් වූයේ පෙරදින තම ගුරුවරිය ඉගැන් වූ දහම් කරුණකි. ඇයට සිහිපත් වූ ඉගැන්වීම විය යුත්තේ,

(i) ත්‍රිශික්ෂාව (ii) තිලක්ෂණ (iii) කර්මය (iv) චතුරාර්ය සත්‍ය

33. ශාසන ඉතිහාසයේ පැවැත් වූ තුන්වැනි සංගායනාවේ ප්‍රධානත්වය ගත් රජතුමා,

(i) කාලාශෝක රජතුමායි. (ii) අජාසත්ත රජතුමායි.

(iii) පැරකුම්බා රජතුමායි. (iv) ධර්මාශෝක රජතුමායි.

34. යහපත් සමාජ සම්බන්ධතා ගොඩ නැංවීම සඳහා මෙන්ම යුතුකම් ඉටු කිරීම මගින් අයිතිවාසිකම් ලබා ගැනීම සඳහාත් උපදෙස් සපයන සූත්‍රදේශනාව වන්නේ,

(i) මහා මංගල සූත්‍රය (ii) පරාභව සූත්‍රය

(iii) වසල සූත්‍රය (iv) සිඟාලෝවාද සූත්‍රය

35. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ගාංග තුන අයත් වන ලක්ෂණය වන්නේ,

(i) සමාධිය (ii) ප්‍රඥා (iii) සීල (iv) භාවනාය.

36. සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මුන පොහොය දිනය වන්නේ,

(i) වෙසක් (ii) ඇසළ (iii) නිකිනි (iv) පොසොන්

37. පළමු ධර්ම දේශනාව නමින් වන සූත්‍ර දේශනාව වනුයේ,

(i) අනත්ත ලක්ඛණ (ii) මංගල සූත්‍රය
(iii) දම්සක් පැවතුම් සූත්‍රය (iv) වසල සූත්‍රය.

38. ශ්‍රී මහා බෝධිය පිහිටා ඇත්තේ

(i) නුවර (ii) අනුරාධපුරය (iii) නවගමුව (iv) කැළණියේ ය.

39. බුදුරජාණන් වහන්සේ හත්වැනි සතිය (7) ගත කරනු ලැබූ ස්ථානය වන්නේ,

(i) රුවන් ගෙය (ii) අජපාල නුගරුක
(iii) අනිමිස ලෝචන පූජාව (iv) රාජායතන කිරිපලු රුක

40. දෙවන ධර්ම සංගායනාවට සහභාගි වූ රහතන් වහන්සේලා සංඛ්‍යාව වනුයේ,

(i) 500 (ii) 600 (iii) 700 (iv) 800

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

1. කෙටි පිළිතුරු සපයන්න.

(i) බෞද්ධයාගේ අත්පොත කුමක් ද?

(ii) බුදුරජාණන් වහන්සේට සෝණ දණ්ඩ බමුණා මුණ ගැසුනේ කොහේ දී ද?

(iii) බුදුරජාණන් වහන්සේ විලක පිපිණු නෙළුමකට සමකළ බැවින් එම ජීවිතය හඳුන්වන නම කුමක් ද?

(iv) අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණකි. එය මංගල සූත්‍රයේ දක්වෙන්නේ කෙසේ ද?

(v) ඡන්ද, දෝස, භය, මෝහ යන සතර හඳුන්වන නම කුමක් ද?

(vi) සමථ භාවනාව වැඩීමෙන් පංච අභිඥා යන අෂ්ට සමාපත්ති උපදවාගෙන සිටි බමුණා කවු ද?

(vii) සල්ලේඛ ප්‍රතිපදාව යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(viii) බුද්ධාදී අටතැන්හි ඇතිවන සැකය හඳුන්වන්නේ කුමන නමකිනි ද?

(ix) බුද්ධ ශාසනයේ දක්වෙන සිව්වනක් පිරිස නම් කරන්න.

(x) භික්ෂු ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය "සිව්පසය" නම් කරන්න.

(2 x 10 = 20)

2. (i) උට්ඨානවතෝ සතිමතෝ......... මෙම ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එහි අදහස ලියන්න.

(iii) අපේ ජීවිතය සාර්ථක කරගැනීමට අවශ්‍ය උපදෙස් ධම්ම පදයෙන් ලැබේ. මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

3. (i) පංච නීවරණ වලින් දෙකක් ලියන්න.

(ii) සමථ භාවනාව වැඩීමට පෙර ඇතිකරගත යුතු ගුණාංග තුන ලියන්න.

(iii) සමථ භාවනාවෙන් ලැබෙන වාසි 4ක් ලියන්න.

4. (i) බුදුරජාණන් වහන්සේගේ චාරිකා ක්‍රම දෙක ලියන්න.

(ii) ඒ දෙක කෙටියෙන් හඳුන්වන්න.

(iii) බුදුරජාණන් වහන්සේ දින චර්යාවට අදාළ කාල සටහන අනුපිළිවෙලින් ලියන්න.

5. (i) බුදුරජාණන් වහන්සේගේ ගුණ ඇගයූ බමුණු පූජකවරුන් දෙදෙනෙක් (සමකාලීන) නම් කරන්න.

(ii) බුදුරඳුන්ගේ ගුණ ඇගයූ පසු කාලීනයන් තිදෙනෙක් නම් කරන්න.

(iii) බුදුරජාණන් වහන්සේගේ විශේෂ ගුණ ලෙස සමකාලීන බමුණු පඬිවරුන් දක් වූ කරුණු මොනවාදැයි ලියන්න.

6. (i) සියලු බුදුවරුන්ගේ අනුශාසනාව දක්වෙන ධම්මපද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ අදහස ලියන්න.

(iii) යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා ඔබට කළ හැකි ක්‍රියාමාර්ග 4ක් යෝජනා කරන්න.

7. (i) ත්‍රි ලක්ෂණ නම් කරන්න.

(ii) ඉන් එක ලක්ෂණයක් විස්තර කරන්න.

(iii) නීවරණ ධර්ම විස්තර කෙරෙන උපමා පහ ලියා දක්වන්න.